**2023 මාර්තු මාසයට අදාළව 2023.03.08 දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව.**

❖ **<u>සහභාගිත්වය:</u>**

| | | |
|---|---|---|
| 01. | රංජිත් පියදිගම මැතිතුමා | - ගරු සභාපති |
| 02. | ආර්.එම්.කාන්ත බිමල් රත්නායක මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. | ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. | ජේ.ජී.නිමල් සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. | එම්.ඒ.එම්.ෂබ්රි මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. | ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. | ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 08. | එම්.ඒ.එම්.රසීදු මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. | කේ.එම්.ජයසුන්දර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 10. | පී.එම්.අමරපාල මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 11. | ජී.එච්.කෝකිල රුෂාන් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 12. | ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 13. | ආර්.එම්.තුෂාරි ප්‍රියදර්ශනී රත්නායක මැතිණිය | - ගරු මන්ත්‍රිනී |
| 14. | යූ.ටී.එම්.තරංගා චිත්‍රාණී පුෂ්පලතා මැතිණිය | - ගරු මන්ත්‍රිනී |
| 15. | පී.අයේෂා චතුර්ණිමා කුෂාන්ති මැතිණිය | - ගරු මන්ත්‍රිනී |
| 16. | ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමා | - ගරු මන්ත්‍රී |

**01.<u>පසුගිය මස සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම:</u>**

2023 පෙබරවාරි මාසයට අදාළව 2023.02.09 වන දින පැවති පසු ගිය සභා රැස්වීමේ වාර්තාව 2023.03.01 දින ම'විසින් සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාහට සහ මන්ත්‍රීතුමියන්ලාහට ලබා දී ඇති අතර, එම වාර්තා මෙම සභාවේ කියවූවාසේ සළකා සභා සම්මත කර ගන්නා මෙන් ගරු සභාපතිතුමන් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි.

ඒ අනුව 2023.01.17 දිනට අදාළ මාසික සභා රැස්වීම් වාර්තාවට සංශෝධන කිසිවක් ඉදිරිපත් නොකළ හෙයින් සත්‍ය වාර්තා බවට ගරු මන්ත්‍රී කේ.එම්.ජයසුන්දර මැතිතුමන් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි. අනතුරුව 2023.01.17 දිනට අදාළ සභා වාර්තාව සත්‍ය වාර්තා බවට ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මත වීය

**02.<u>ගරු සභාපතිතුමාගේ (මූලාසනයේ) විශේෂ නිවේදන:</u>**

2023 මාර්තු මාසයට අදාළව පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමන්ගේ කාරුණික ආරාධනය පිළිගෙන පැමිණි ගරු උප සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත් සහා ලේකම්තුමන් ඇතුළු සභාවේ කාර්ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමින් ගරු සභාපතිතුමන් අද දිනයට නියමිත විශේෂ නිවේදන සභාවට ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව අද දිනය කාන්තාවන් සඳහා වෙන්කර ඇති ජාත්‍යන්තර කාන්තා දිනය බව ගරු සභාපතිතුමන් සභාව ආරම්භයේදීම සඳහන් කරන ලදි. අප රටේ ආර්ථිකය නගාසිටුවීමට කාන්තාවන් විශාල දායකත්වයකි සපයයි. තේදළු නෙලන අම්මාගේ සිට කම්කරු පන්තිය, විවිධ ස්ථරයන් නියෝජනය කරමින් සමාජ ප්‍රගමනයට කාන්තාවන් විශාල දායකත්වයක් දක්වයි.වර්තමානය වන විට ලංකාවේ 52% ක් සිටිනුයේ කාන්තාවන් වේ.මොනරාගල දිස්ත්‍රික්කය

ගත් කල 53% ක් සිටින්නේ කාන්තාවන් , අනෙක් ප්‍රමාණය පිරිමි පුදගලයින් වේ. මැදගම පත්තුවේත් ගොවිපලේ,වැඩ බිමේ, ගල් මෝලේ වැඩයෙහි යෙදෙන සෑම දිරිය කාන්තාවකටම උපහාරය පුද කරන ලදි. ඊයේ දිනයේ දරුවන් 13 න් දෙනකු සමාජයට බිහිකල දිරිය කාන්තාවක් මියගොස් අවසන් කටයුතු සිදු කල බව සදහන් කරන ලදි. එවන්වූ විශාල දායකත්වයක් දැක්වූ කාන්තාවන්, වෛද්‍යවරියන්, ගමේ සිටි වෙද නෝනලා, ගෞරවනීය මෙහෙණින් වහන්සේලා වැනි සමාජයට දායකත්වය දක්වන විශාල කාන්තාවන් , අම්මාවරුන් ප්‍රමාණයක් පිරිසක් සිටියි.ඒ සියළුම දෙනාට උපහාර කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

එසේම සභාවේ ධූර කාලය මාර්තු මස 19 වන දිනෙන් අවසන් වීමට යෝජිතව පවතින අතර, තවත් දින කිහිපයක් සභාවේ ධූර කාලයෙන් ඉතිරිව පවතින බවත්, මෙතෙක් කරගෙන ආ වැඩ පිළිවෙල ඉදිරියටත් පවත්වාගෙන යෑමට ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය බලාපොරොත්තු වනවාසේම ඉදිරි දින කිහිපයේත් හැකියාව පවතින ආකාරයට සභාපතිතුමන්ලාගේ සේවාව හොදින් ඉටු කිරීමට බොහොමත්ත ගෞරවයෙන් යෝජනා කරන ලදි.

ඒවාගේම මන්ත්‍රී මණ්ඩලය සදහා දීමනා ලබාදීමේදී පළාත් පාලන කොමසාරිස්තුමා විසින් චක්‍රලේඛනයක් නිකුත් කර තිබෙනවා දින ගණනට දීමනාව ගෙවීමට. නමුත් දීමනාවක් යනු වැටුපක් නොවේ. එනිසා දින ගණන ගණනය කිරීම තුල වරදක් තිබේ. මීට පෙර ප්‍රධාන අමාත්‍යතුමන් යොමුකල ලිපි අනුව සභාවට එක් දිනක් පැමිණියත් දීමනාව ගෙවි යුතු බව. මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් පළාත් පාලන කොමසාරිස්තුමන් සමඟ සාකච්ඡා කල බවත්, ඒ සදහා ඉදිරියේදී යම් පිළිතුරක් ලැබෙයි කියා විස්වාසයක් පවතින බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

විශේෂයෙන් අද දිනය ලෝක කාන්තා දිනයසේම ඉදිරියේදී වැඩිහිටි දිනයද ඉදිරියේදී පැවැත්වේ. සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමේදී ආබාධිත පුද්ගලයින්ට පිවිසීමට පිවිසුම් මාර්ගයක් සකස් කිරීමට නොහැකිවූ බව සදහන් කරන ලදි. ප්‍රධාන ශාලාවට ඇතුළුවීම සදහා පිවිසුම් මාර්ගයක් සකස් කිරීමට හැකියාව ලැබුනද වේදිකාවට පිවිසීම සදහා පිවිසුම් මාර්ගයක් සකස් කර ගැනීමට නොහැකි වූ බව සදහන් කරන ලදි. මෙය අඩුපාඩුවක් ලෙසද පෙන්වාදී ඇති බැවින් ඉදිරියේදී සිටින කවුරුන් හෝ එකතුවී සම්මන්ත්‍රණ ශාලාවේ වේදිකාවට ඇතුළුවීමට හැකි පරිදි නියමිති ආනතිය පවතින ආකාරයට සකස් කල යුතු බව පෙන්වා දෙන ලදි.

ඒවාගේම ලෝක බැංකුවේ නියෝජිත පිරිස මේ දිනවල මොනරාගල දිස්ත්‍රික්කයේ නිරීක්ෂණ චාරිකාවක නිරතවන බවත්, LDSP ව්‍යාපෘතිය යටතේ සිදුකරන ව්‍යාපෘති අධීක්ෂණය සදහා එම කණ්ඩායම පැමිණ සිටින බවත්, මැදගම බල ප්‍රදේශයේ කර්මාන්ත පරීක්ෂාව සදහා ඉදිරි දිනවල පැමිණීමට යෝජිත බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. එම කණ්ඩායම ඉදිකර ඇති සතිපොළ සම්බන්ධයෙන් සෑහීමකට පත්ව සිටින බැවින් එම කටයුතු පරීක්ෂා කිරීමට අදාළ කණ්ඩායම පැමිණෙන බවත්, එම කණ්ඩායම සමඟ සාකච්ඡා කර තවත් මුදල් ප්‍රමාණයක් ලබා ගැනීමට උත්සාහ ගන්නා බවත්, ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

එසේම සතිපොළ භූමිය නිර්මාණය කලද නැවත වරක් කොන්ක්‍රීට් නොකරන ලද කොටස ගවයින් සිටින නිසා මඩවී ව්‍යාපාරික් මහතුන්ට තම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑමට නොහැකි තත්වයක් උදාවී තිබේ.එබැවින් ඉදිරියේදී හැකියාවක් ලැබුන හොත් එම කොටසද කොන්ක්‍රීට් කර ව්‍යාපාරික මහතුන්හට සේවය සපයා දීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි. ඒවාගේම කැන්දවින්න මාර්ගයේ තිබූ ව්‍යාපාරික ස්ථාන දෙකක් ඉවත් කර ඒ සදහා නව ගොඩනැගිල්ලෙන් ව්‍යාපාරික ස්ථාන දෙකක් ලබාදී කැන්දවින්න මාර්ගයට සම්බන්ධවීම සදහා තාවකාලිකව මාර්ගයක සකස් කිරීමට හැකියාව ලැබුණ අතර එම මාර්ග සකස් කරගතහොත් පමණයි සතිපොල සදහා නියම වටිනාකමක් හිමි වන්නේ.සෙනසුරාදා දිනයේ පැවැත්වෙන තොග පොළ තවමත් පවතිවන්නේ බස්නැවතුම්පල භූමියේ යි. එබැවින් කඩිනමින් මාර්ග සකස් කර තොග පොළත්

පැවතුන ආකාරයට සතිපොළ භූමියට ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම රත්තනදෙණිය හොරගොල්ල මාර්ගය පසුගිය කාලයේ ග්‍රාමීය මාර්ග පිළිසකර කිරීම වෙනුවෙන් පස් ප්‍රවාහනය කිරීම හේතුවෙන් අබලන් තත්වයට පත්ව තිබුණි. එසේ පස් ප්‍රවාහනය කිරීම තුලින් ඇතිවූ තත්වය මත ගම්මානයේ ජනතාව සමඟ සාකච්ඡා කරන ලද සාකච්ඡා වලදී එකඟතාවය ලැබුණේ පස් ප්‍රවාහනය සඳහා දායකවූ අයගෙන් රු.100000.00 ක මුදලක් සභාවේ තැන්පත් කර එම මුදල් සභා අරමුදලට මාරුකර මාර්ගය නිර්මාණය කිරීමට. ඒ අනුව මේ වන විට සභා අරමුදලේ රු.100000.00 ක මුදලක් තැන්පත් කර ඇති අතර, එම මුදලද යොදවා ගම්මානයේ ජනතාවගේ ශ්‍රමදායකත්වයද ලබාගෙන, සභාවේ කම්කරුවන්ද යොදවාගෙන යන්ත්‍ර සූත්‍රද යොදවා මාර්ගයේ සංවර්ධන කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි.මෙම මාර්ගය පරීක්ෂා කිරීම සඳහා සභාවේ කාර්මික නිලධාරී මහතුන් සම්බන්ධවූ අතර, මේ සම්බන්ධයෙන් මොනරාගල පොදු වැඩ ඉංජිනේරු මහතා සමඟද සාකච්ඡා කර ඇත. මාර්ගය සකස් කිරීම සඳහා ඔවුන්ගේ සහයද ලබාදෙන බව ප්‍රකාශ කල බව සඳහන් කරන ලදි.

ඒවාගේම කැන්දවින්න අලාන මාර්ගය දැඩි ලෙස අබලන්වී පවතියි. කන්ද ප්‍රදේශයේ මීට පෙර අවස්ථාවක ට්‍රැක්ටරයක් පෙරලී යෑම හේතුවෙන් ජීවිතහානි සිදුවී තිබේ. එම අවස්ථාවේ ගම්මානයේ ජනතාව උද්ඝෝෂණ කිරීමට උත්සාහ ගත්බවත්, එම අවස්ථාවේ ගරු සභාපතිතුමන් මැදිහත්ව ජනතාවට කඩිනමින් මාර්ගය සකස් කර දෙන බව පවසමින් උද්ඝෝෂණය නැවැත්වූ බව ප්‍රකාශ කරන ලදි. එම මාර්ගයේ අවධානම්ව පවතින කොටස හෝ කඩිනමින් සකස් කිරීමට බලාපොරොත්තු වන බව වැඩිදුරටත් සඳහන් කරන ලදි.

එසේම අයිවෙල කොටබෝව මාර්ගය පළාත් සභාවට අයත් මාර්ගයකි. මෙම මාර්ගය මාර්ල කිලෝමීටර් ලක්ෂය ව්‍යාපෘතියට භාරදී සංවර්ධන කටයුතු සිදු කිරීමට උත්සාහ ගත්තත් පසුගිය කාලයේ පැවති අරගලකාරී තත්වය හා අනෙකුත් හේතූන් මත කොන්ත්‍රාත්කරුවන් සංවර්ධන කටයුතු වලින් ඉවත් වුණි. මේ ආකාරයට බල ප්‍රදේශයේ මාර්ග 08 ක පමණ සංවර්ධන කටයුතු අතරමඟ නැවතුණි. වර්තමානය වෙද්දී අයිවෙල කොටබෝව මාර්ගයේ විශාල වලවල් ප්‍රමාණයක් නිර්මාණය වී තිබේ. මේ සම්බන්ධයෙන් පසුගිය මස පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කල අතර, එහිදී සංවර්ධන කටයුතු සඳහා මුදල් නොමැති බව සඳහන් කල බව පෙන්වාදෙන ලදි. නමුත් ගම්මානයේ ජනතාව ප්‍රකාශ කර ඇත්තේ සභාවේ යන්ත්‍රසූත්‍ර ලබා දෙන්නේ නම් ශ්‍රමදාන මට්ටමින් සහයෝගය ලබා දී මාර්ගය තාවකාලිකව සකස් කර ගත හැකි බවයි. ඒ ආකාරයට මාර්ගය තාවකාලිකව හෝ සකස් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම 10 කණුව අලංමුල්ල මාර්ගයේ බෝක්කුව සකස් කිරීමේ කටයුතු කොන්ත්‍රාත් සමාගමකට භාරදී වැඩකටයුතු ආරම්භ කල අතර, එම ආයතනය විසින් පාලම කඩා මූලික වැඩකටයුතු සිදු කරගෙන ගිය බවත්, ඉදිරියට පවත්වාගෙන යෑමට නොහැකි විය. එනිසා ඔවුන් උපකරණ සියල්ල රැගෙන ගොස් තිබේ. පාලමේ වැඩ නතරවීම හේතුවෙන් මාර්ගය හරස් කර උද්ඝෝෂණ 02 ක් පැවැත්වුණ බවත්, එම අවස්ථාවේ ප්‍රාදේශීය ලේකම්තුමා, සභා ලේකම්තුමා ගොස් සාකච්ඡා කර එකඟතාවයට පැමිණියේ අවශ්‍ය උපකරණ ලබාදී ගම්මානයේ ජනතාවගේ ශ්‍රමදායකත්වය ලබාගෙන සභාවෙන් බෝක්කුවට ලබාදී ඇති අතර, ඒවා යොදවාගෙන මාර්ග සංවර්ධන අධිකාරියෙන් සුළු මුදලක් ලබාදීමට එකඟතාවය පල කර ඇති බැවින් එම මුදලද යොදවා බෝක්කුව සකස් කර ගැනීමට සැලසුම් කර ඇති බව ප්‍රකාශ කරන ලදි. ඒ ආකාරයට සමස්ථයක් ලෙස ප්‍රදේශයේ සිදුකල යුතු සංවර්ධන කටයුතු සඳහා දායකත්වය ලබාදෙන බව වැඩිදුරටත් සඳහන් කරන ලදි.

එසේම සතිපොළ භූමියේ අඩක් නිම කර තිබූ ගොඩනැගිල්ල නිරීක්ෂණය කිරීමට පසුගිය මාසයේ සහභාගීවූ අතර, එහිදී පැවතුනාවූ අඩුපාඩුවක් ලෙස වහලය සකස් කිරීමේ කටයුතු මේවන

විට සිදුවෙමින් පවතින බවත්, ඒවාගේම බිම් කොටස කොන්ක්‍රීට් කිරීමේ කටයුතු මුදල් තත්වය යහපත් තත්වයට පත්වුවහොත් සිදු කරන බවත්, හෙට දිනයේ පැමිණීමට නියමිත ලෝක බැංකු කණ්ඩායම සමඟත් සාකච්ඡා කර එම කටයුතු සිදුකර ගැනීමට උත්සාහ ගන්නා බව ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම ළමා උද්‍යානය මැදගම ප්‍රදේශයට පැවතුනාවූ විශාල අඩුපාඩුවකි. දරුවන්ට සෙල්ලම් කිරීමට දරුවකුගේ ශරීරය වර්ධනය වීමට අවශ්‍ය ක්‍රියාකාරකම් කිරීමට අවශ්‍යවන්නාවූ ස්ථානයක් නොපවතියි. එනිසා ඒ අය වෙනුවෙන් ළමා උද්‍යානය නිර්මාණය කෙරෙමින් පවතින බවත්, ළමා උද්‍යානය තුල බෝට්ටු අංගනයක් ඉදිකර දරුවන්ට ජල ක්‍රීඩා කිරීමට අවස්ථාව සලසා දෙන බවත්, ප්‍රකාශ කරන ලදි. පසුගිය දිනක ක්‍රීඩා පිටියේ පැවති සංදර්ශනයක බෝට්ටු සවාරියක් යෑමට රු.400.00 ක මුදලක් අයකරන ලදි. එනිසා එවන්වූ කුඩා දරුවන්ට සහනයක් සැලසීමට බෝට්ටු අංගනයක් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන බව සඳහන් කරන ලදි. සමස්ථ මැදගම පත්තුවේම පෙරපාසල් දරුවන් කැඳවා දිනයන් වෙන් කර දරුවන්ගේ ක්‍රියාකාරකම් වර්ධනය කර ගන්නාවාසේම දෙමාපියන්ට සෞඛ්‍ය සායන ආදිය පවත්වා දරුවන්ගේ අනාගතය අභිවෘද්ධිය ඇති කිරීමට බලාපොරොත්තු වන බවත්, ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකරමින් පවතින බවත්, ඒ වෙනුවෙන් ළමා උද්‍යානයේ සංවර්ධන කටයුතු යහපත් ආකාරයෙන් සිදු කරමින් පවතින බව වැඩිදුරටත් සඳහන් කරන ලදි.

එසේම සභාවක් ලෙස දරුවන්ගේ යහපතසේම දෙමාපියන්ගේ සෞඛ්‍ය සම්පන්න භාවය පිළිබඳවත්, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අතහිත දීම වෙනුවෙන් පසුගිය දිනවල පැවති පෙරපාසල් විසිර යෑමේ උත්සව වෙනුවෙන් සභාවක් ලෙස සහභාගිව පුංචි තිළිණයක් පරිත්‍යාග කර සභාවේ දායකත්වය සමස්ථ දරුවන් වෙනුවෙන් ලබාදුන් බව ගරු සභාපතිතුමන් පෙන්වා දෙන ලදි. එසේ පෙර පාසලෙන් විසිර යන දූවා දරුවන් සඳහා විධිමත් පාසලක් නිර්මාණය කර තිබෙන අතර, එම පාසලේ කටයුතු ඉදිරියේදී බොහොමත්ම සාර්ථකව සිදු කර දරුවන්හට මූලික අධ්‍යාපනය ලබාදී හොඳමදේ දරුවන්ට ලබාදීමෙහිලා කටයුතු කරන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

ඒත් එක්කම ගරු මන්ත්‍රී මණ්ඩලය මෙතෙක් ලබාදුන් සහයෝගය ඉතා අගයකොට සලකන බවත්, වසර 05 කාලයක් මාර්තු මාසයේ 19 /20 වන විට ගත වෙමින් පවතියි. ඒ වසර 05 ක කාලය පුරාවටම ප්‍රදේශයේ දියුණුවට සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා තම තමන්ට හැකි අයුරින් දායකත්වය ලබාදුන් අතර, පෞද්ගලිකවත් රාජකාරී මට්ටමිනුත් දායකත්ව දැක්වූ අවස්ථාද පවතියි. තම තමන්ගේ අදහස් ඉදිරිපත් කර තමන්ගේ ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් කටයුතු කල අතර, ඒ අදහස් ප්‍රකාශ කිරීම් තුල සභාව තුල යම් යම් බහින්බස්වීම් ඇති වුණි එසේ සිදුවූයේ විවිධ අවස්ථාවලදී එකිනෙකාට සම්බන්ධ නොවන විවිධ අරමුණු ඔස්සේ විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ විවිධ විශයන් ඔස්සේ කතාබහ කිරීම තුලයි. ඒසේ අදහස් ඉදිරිපත් කිරීම තුලින් තමන් තුල තිබූ දැනුම වර්ධනය කර ගත්තා සේම ඒ දැනුම උකහාගෙන ජනතාව වෙනුවෙන් යමක් කිරීමට ගරු සභාපතිතුමන්ලා උත්සාහ ගත් බවත්, ඒ සඳහා කැපවීම් කල හැම දෙනාටම ස්තූතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදි. ඒවාගේම මන්ත්‍රී මණ්ඩලයේ සියළුම දෙනාට ඉදිරියේදීත් මේ සභාවට තේරීපත්ව යුතුකම් ඉටු කිරීමට වාසනාව ශක්තිය,ධෛර්යය ලැබෙවා කියා ප්‍රාර්ථනා කරන ලදි.

එසේ ඉදිරියේදී ලෝක වැඩිහිටි දිනය පැවැත්වීමට සැලසුම් කර ඇති අතර, වැඩිහිටියන් වෙනුවෙන් සුවතා මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර තිබේ. වැඩිහිටියන් වෙනුවෙන් ඒ අයගේ දිවා කලය ගත කිරීමට හැකිවන පරිදි බොහෝ වැඩිහිටියන් බෝනොවන රෝග වලට ගොදුරුවී සිටියි. ඒවායෙන් මිදීමට, ශරීර සෞඛ්‍ය වර්ධනය කර ගැනීමට හැකිවන ස්ථානයක් ළමා උද්‍යානයට යාබඩව නිර්මාණය කිරීමට බලාපොරොත්තුවක් පවතින බවත්, ඒ සඳහා අවශ්‍ය වන ලේඛන සකස් කර අදාළ ආයතන සඳහා යොමු කර තිබෙන බවත්, ඉදිරියේදී අවස්ථාව ලැබුනහොත් වැඩිහිටියන් වෙනුවෙනුත්, කුඩා දරුවන් වෙනුවෙනුත්, සමස්ථ ජනතාව

වෙනුවෙනුත් යුතුකම් ඉටුකලා යැයි හැඟේ. ඒ ආකාරයට සමස්ථ ජනතාවගේ යහපත වෙනුවෙන් සභාවක් ලෙස සියළු යුතුකම් ඉටු කරමින් පැවතියා.ඒ සඳහා සහය දැක්වූ සියළුම දෙනා නැවතත් බොහොමත්ම ගෞරවයෙන් සිහිපත් කරමින්, ගරු සභාපතිතුමන් අද දිනයට නියමිත විශේෂ නිවේදන සභාවට ඉදිරිපත් කිරීම අවසන් කරන ලදි.

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ/පෙත්සම්/පැමිණිලි හා සංනිවේදන:-**

**03.01.නාම පුවරුවක් දැමීම සම්බන්ධවයි.**

කැන්දවින්න පාර, මැගම ලිපිනයේ පවත්වාගෙන යනු ලබන සැලෝන් දුලංකා ආයතනය ඉදිරිපිට නාම පුවරුවක් දැමීම සඳහා අවසර ලබාදෙන ලෙසට ඉල්ලීමක් කරමින් සභාව වෙත යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා

නාම පුවරුවක් සවි කරන්නේ නම් එහි වර්ග අඩි ප්‍රමාණය සොයා බලා මුදලක් අය කල යුතුවේ. එක් ව්‍යාපාරික ස්ථානයක සවිකල හැක්කේ මුදල් නොගෙවන එක් නාම පුවරුවක් පමණි. එයට අමතරව සවි කරන අනෙක් පුවරු සඳහා මුදලක් අය කිරීමට සිදුවන පෙන්වා දෙන ලදි.

**03.02.අංක 01 කඩකාමරය සඳහා ජලය ලබා ගැනීමටයි.**

10 කණුව,මැදගම, බිබිල ලිපිනයේ පදිංචි එම්.ජේ.එල්.අයිසල් මහතා විසින් පවත්වාගෙන යනු ලබන අංක 01 කඩ කාමරය සඳහා ජලය ලබා ගැනීම සඳහා අවසර ලබා දෙන ලෙසට ඉල්ලීම් කරමින් ගරු සභාපතිතුමන් වෙත යොමු කර තිබූ ලිපිය සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා

කාර්මික නිලධාරීතුමන් අධීක්ෂණයක් සිදුකල පසු ජලය ලබා ගැනීමට අවසර ලබා දෙන්න.

**03.03.පශු එන්නත්කරුවන් සඳහා ලබාදෙන ඉන්ධන දීමනාව වැඩිකර ගැනීම සම්බන්ධවයි.**

පළාත් පාලන ආයතනවලට අදාළව කොට්ඨාශයේ සතුන්ට ජල භීතිකා මර්ධන එන්නත් ලබා දීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල සේවයේ නියුතු පශු එන්නත්කරුවන් මගින් සිදු කරන බැවින් ඒ සඳහා පශු එන්නත්කරුවන් හට මාසිකව පෙට්‍රල් ලීටර් 10ක් වත් ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලීම් කර තිබේ.2022.08.17 දිනැති ඉල්ලීම් ලිපියට අනුව පශු එන්නත්කරුවන් සඳහා රු.3000.00 ක ඉන්ධන දිමනාව සභා තීරණයකට අනුව ලබාදෙන ලෙසට ඉල්ලීම් කර ඇති අතර, පශු එන්නත්කරුවන් සඳහා සභා තීරණයක් අනුව රුපියල් 3000.00 ක මුදල් ගෙවීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස දන්වා මොනරාගල පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් අප සභාව වෙත යොමු කර ඇති ලිපිය ගරු සභාවේ දැන ගැනීම පිනිස ගරු සභාපතිතුමන් විසින් සභාවටඉදිරිපත් කරන ලදි.

**04.** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න : - නැත

**05.** යථා පරිදි කල්දී ඇති යෝජනා :-

**05.01.යෝජනාකරු:- ගරු සභාපති - රංජිත් පියදිගම මැතිතුමා**

**<u>යෝජනාව : -</u>**

**06. <u>කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u> :-** නැත

**07. <u>ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශනය</u> :-**

2023 ජනවාරි මාසයට අදාළ ආදායම් වියදම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට

යෝජනාව :- ගරු මන්ත්‍රී - කේ.එම්.ජයසුන්දර මැතිතුමා

යෝජනා ස්ථිරත්ව :- ගරු මන්ත්‍රී - ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් 2023 ජනවාරි මාසයට අදාල ආදායම් වියදම් සාරාංශ සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලදි. එහිදී ගරු මන්ත්‍රී උදය බන්දු මැතිතුමන් 2023 ජනවාරි මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කර බෙදුමක් ඉල්ලා සිටින ලදි. එම අවස්ථාවේ ගරු මන්ත්‍රී - ඩබ්.එම්. උදය බන්දුල මැතිතුමන් කළ යෝජනාව සම්බන්ධයෙන් සෙසු ගරු මන්ත්‍රී මණ්ඩලය එකඟත්වය පල නොකල බැවින් 2023 ජනවාරි මාසයට අදාළ ආදායම් වියදම් වාර්තාව සඳහා ගරු මන්ත්‍රී - ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමන්ගේ විරුද්ධත්වය සටහන් කරගත් අතර, සෙසු ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත ආදායම් වියදම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සභා සම්මත කර ගන්නා ලදි.

**08.හදිසි කරුණු හා වෙනත් කරුණු**

08.01.ක්‍රීඩාපිටිය අසල මත්ද්‍රව්‍ය භාවිත කිරීම වැලැක්වීම (ගරු මන්ත්‍රී - නිමල් සරත් කුමාර මැතිතුමා)

**09.ගරු මන්ත්‍රීතුමන්ලා / ගරු මන්ත්‍රීතුමියන්ලා විසින් අදහස් හා යෝජනා ප්‍රකාශ කිරීම :-**

**09.01.ගරු මන්ත්‍රී - ජේ.ජී.නිමල් සරත් කුමාර මැතිතුමා**

**10.** මීලඟ සභා රැස්වීම 2023.03.08 වන දින පෙ.ව. 9.30 ට මැදගම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට තීරණය කරන ලදි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2023.02.09

මැදගම ප්‍රාදේශීය සභාව.

පිටපත්:-

| | | |
|---|---|---|
| 01. | ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමා, බදුල්ල | - කා.දැ.ගැ.ස. |
| 02. | පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා, මොණරාගල | - කා.දැ.ගැ.ස |
| 03. | විගණන අධිකාරීතුමා , මොණරාගල. | - කා.දැ.ගැ.ස |